- **ආදරණීය දුවේ පුතේ,**
- **පහත ඡෙදය කියවන්න**

රෝස මල

මගේ මිදුලේ රෝස පඳුරකි. රෝස පඳුරේ රෝස මලක් පිපී ඇත.එය බොහෝ අලංකාර ය. එය තද රතු රෝස මලකි. එය වටා සමනල්ලු පියාඹති. රෝස මලේ ලස්සන වචනයෙන් විස්තර කළ නොහැකි ය. එය ඒ තරම් ම ප්‍රිය උපදවන මලකි. එහෙත් එය දිනෙක පර වී යනු ඇත.

ඡේදයෙන් පැවසෙන්නේ 'රෝස මල' පිළිබඳ ව බවත් රෝස මල විස්තර කිරීම සඳහා 'එය' යන පදය භාවිත කර ඇත.
ඔබත් "එය" යන පදය භාවිත "රෝස මල" ගැන විස්තරයක් කරන්න.

රෝස මල

මගේ නිවසේ රෝස පඳුරකි.
රෝස පඳුරේ රෝස මලක් පිපී ඇත.
. . . . . .
. . . . . .
. . . . . .
රෝස මලේ ලස්සන වචනයෙන් විස්තර කළ නොහැකි ය.
. . . . . .
. . . . . .

- **පහත වාක්‍ය "එය" යන පදය යොදා සම්පූර්ණ කරන්න**

ගැළපෙන පරිදි 'එය' යන පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
1. අහසේ හඳ බබළයි.
. . . . . මුළු රාත්‍රිය ම ආලෝකවත් කරයි.
2. මල්ලී සෙල්ලම් කාරයක් සාදයි.
. . . . . ඉතා අලංකාර ය.
3. තිසර පුස්තකාලයෙන් පොතක් ගනියි.
. . . . . ඉතා වටිනා පොතකි.
4. ඈතින් ගොඩනැගිල්ලක් පෙනෙයි.
. . . . . ඉතා දැකුම්කලු ය.
5. නංගී මල් ගවුමක් අඳියි.
. . . . . අම්මා මැසූ එකකි.